ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
-----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම
---------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,
මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව
---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව රු.104,719,508 ක ශේෂයට අක්මුදල් ගැලපීම් ගිණුමක් නිවැරදිව සකස් කර නොතිබුණි. | නිවැරදිව අක් මුදල් ගිණුමක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. | විගණනය විසින් පෙන්වා දීමෙන් පසු රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 හි 7 (vi) ඡේදය අනුව අක් මුදල් ගැලපීම් ගිණුමක් සකස් කර විගණනයට ඉදිරිපත් කරන ලදි. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.281,472,925 ක ස්ථාවර වත්කම් පෙන්නුම් කළද, ස්ථාවර වත්කම් වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වර්ෂය අවසානයේ ස්ථාවර වත්කම් වාර්තාවක් විගණනයට ඉදිරිපත් කළ යුතුය. | 2018 වර්ෂයේදී CIGAS වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී සිදු වූ දෝෂයන් හේතුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් එම දත්ත මකා දමා ඇති අතර ඉදිරියේදී එම ලේඛනය විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව 2018 ජනවාරි 01 දිනට ශේෂය රු.37,360,122 ක් වූ අතර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම ශේෂය රු.2,596,211,542 ක් වූ බැවින් රු.222,261,420 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සසඳා ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. | ආරම්භක ශේෂ වශයෙන් ගිණුම්ගත කල වත්කම් වාර්තාව (Bos Report) තුළනය නොවීම මත අවලංගු කර ඇති බැවින් ඒවාද නැවත පරිගණක වැඩසටහන තුළට ඇතුළත් කරගෙන යනු ලැබේ. |
| (iii) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් වටිනාකම රු. 21,851,383 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව මිලදී ගැනීම් ලෙස රු.14,165,029 ක ශේෂයක් දක්වා තිබුණි. | -එම- | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2018 දී දරන ලද වියදම වන රු. 13,248,754 ක් ගිණුම් ගත කර ඇති අතර අනෙකුත් දෙපාර්තමේන්තු විසින් 2018 වර්ෂයේදී රු.8,602,729 ක වියදම සමඟ එකතුව රු.21,851,483 ක් මූල්‍ය ප්‍රකාශයේ ACA-6 හි වර්ෂයේ මිළදී ගැනීම් ලෙස දක්වා තිබේ. |

(ආ) මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව තැන්පතු ලැබීම්වල වටිනාකම රු.36,899,162 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව එම ශේෂය රු.37,725,353 ක් වූ බැවින් රු.826,191 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදලින් ලැබූ සහ හරස් සටහන්වලින් ලැබූ මුළු තැන්පතු වටිනාකම මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතුය. | තැන්පත් ගිණුම යටතේ මුදලින් ලැබී ඇති ප්‍රමාණය රු.36,899,162 ක් වූ අතර හරස් සටහන් ලැබීම් රු.826,191 ක් විය. එම අගයන් දෙකේ එකතුව භාණ්ඩාගාර මුද්‍රිතපිටපතේ එකතුවක් ලෙස දැක්වේ. |
| (ii) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි අත්තිකාරම් ලැබීම් ලෙස රු.587,455 | මුදලින් ලැබූ සහ හරස් සටහන්වලින් ලැබූ මුළු තැන්පතු වටිනාකම මූල්‍ය | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ මුදලින් ලැබීම් මූල්‍ය කාර්ය |

| | | | |
|---|---|---|---|
| | ක් දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව එම ශේෂය රු.31,555,342 ක් වූ බැවින් රු.30,967,887ක වෙනසක් නිරීක්ෂණය විය. | කාර්යය සාධන ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතුය. | සාධන ප්‍රකාශනයෙහි දක්වා තිබේ. 2018 දෙසැම්බර් 31 දිනට හරස් සටහන් ලැබීම් හා මුදලින් ලැබීම් වල එකතුව රු.31,555,343 ක් අත්තිකාරම් ගිණුමට බැර වී තිබේ. |
| (iii) | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් ලෙස රු.79,643,440 ක් දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව ශුද්ධ ආදායම රු.113,074,077 ක් වූ බැවින් රු.33,430,637 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අග්‍රිම ගිණුමට අදාළ මුළු ලැබීම් රු.1,086,631,057 සකස් වී ඇති ආකාරය වෙන් වෙන්ව දක්වා තිබේ. මාසික ගිණුම් සාරාංශ අනුව කිසිදු වෙනසක් නොමැති බැව් කරුණාවෙන් සලකන්න. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වාර්තාව හා තැන්පත් ලේඛනවල ආරම්භක ශේෂ අතර රු.31,599 ක වෙනස්කම් පැවතුණි. | රු.31,599 ක වෙනස නිරවුල් කර ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. | තැන්පත් ලේඛන අතර රු.11,601 ක ශුද්ධ වෙනසක් හඳුනාගෙන ඇති අතර එය නිරවුල් කිරීමට කටයුතු යොදා තිබේ. |

### 1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මියගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය සේවකයන් 11 දෙනෙකුගෙන් 2013 වර්ෂයේ සිට අයවිය යුතු රු.429,818 ක ණය මුදල 2019 මැයි මාසය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.597,519 ක ණය ශේෂ 2019 මැයි මස නිරවුල් කිරීමට කටයුතු කර ඇත. ඉතිරි රු.245,330 ක ණය ශේෂය ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | 2001 වර්ෂයේදී සේවය හැරගිය නිලධාරියෙකුගෙන් අයවියයුතු රු.232,965 ක දේපල ණය ශේෂය නීතිපති | රු. 232,965 ක ණය ශේෂ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කාර්යාල කාර්යය සහායකයෙකු සේවය අතහැර ගොස් ඇති අතර, එවැනි අවස්ථාවක ගතයුතු |

| | | |
|---|---|---|
| උපදෙස් මත ප්‍රාදේශීය ලේකම් විසින් ඇසිකිසි ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දන්වා ඇති හෙයින් ණය ශේෂය නිරවුල් කර නොතිබුණි. | | ක්‍රියාමාර්ග පිළිබඳ ආයතන සංග්‍රහයේ xxiv හි දක්වා නොමැති නමුත් 4:4:1 හි දක්වා ඇති පරිදි අයකරගත නොහැකි මුදල පිළිබඳ නිතිපතිගෙන් උපදෙස් ලබාගෙන ඇත. නිතිපති විසින් ලබාදුන් උපදෙස් අනුව ඇසිකිසි ක්‍රියාත්මක කිරීමට නොහැකි බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇති අතර මුදල් රෙගුලාසි 109 යටතේ ණය මුදල් කපා හැරීම සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කරමින් පවතී. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

--------------------------------------------

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහ දැක්වීම |
|---|---|---|
| (අ) ඇප ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඇප ලේඛනය සකස් කරමින් පවතින බව දක්වා ඇත. |

(ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය
--------------------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වාගත යුතුය. | පිළිතුරු ලබාදී නැත |

(ඇ) වාහන ලැයිස්තු ගතකිරීමේ ලේඛනය
-------------------------------

| | | |
|---|---|---|
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුය. | වාහන ලැයිස්තුගත ලේඛනයක් සකස් කර ඇත. |

(ඈ) ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය
----------------------------------------

| | | |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වාගත යුතුය. | තාක්ෂණික ඇගයීම් කමිටු පැමිණීමේ ලේඛනයක් 2019 වර්ෂයේ සිට ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්
------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේදී නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත |

1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
--------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවල අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිරීක්ෂණය | | | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | |
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| i. | xix පරිච්ඡේදයේ 5.6 උප වගන්තිය | - | නිල නිවාස 33 ක් සම්බන්ධයෙන් ආර්ථික කුලිය | අමාත්‍යාංශ ලේකම්වරයා ගේ අනුමැතිය | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පදනම් කර ගෙන තිබුණද ඊට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ලබාගැනිමට කටයුතු කළ යුතුය. | ලබාගැනීමට කටයුතු කර ඇත. |
| ii. | xix පරිච්ඡේදයේ 6.1.1 උප වගන්තිය | - | සියලුම රජයේ නිවාසවල බදු කාලය වර්ෂ 05ක් වුවද දෙපාර්තමේන්තුට අයත් නිල නිවාස 08 ක නිලධාරීන් වර්ෂ 06 සිට වර්ෂ 18 දක්වා කාලයක් රැඳී සිටින බව නිරීක්ෂණය විය. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එක් එක් කේෂ්ත්‍රවල විශේෂිත දැනුම සහිත නිලධාරීන් වන බැවින් අදාළ පර්යේෂණ මධ්‍යස්ථාන අසලම පදිංචිව සිටීම හා ව්‍යාප්ති නිලධාරීන් අදාළ කොට්ඨාශ ආසන්නයේ පදිංචිව සිටීම හේතුවෙන් නිල නිවාස ලබාදී ඇත. නිලධාරීන් පුරප්පාඩු බැවින් ඇතැම් නිලධාරීන්ට දීර්ඝ කාලයක් එකම නිල නිවාසයේ පදිංචිව සිටි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | දෙපාර්තමේන්තුව සතු වාහන 95 කින් වාහන 44 කට අදාළව ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුය. | වාහන 51 ක ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට ඇත. |
| (ඇ) | 2017 මාර්තු 22 දිනැති කල්බදු වාහන සඳහා වූ ගිවිසුමෙහි 03 ඡේදය | - | සෑම වාහනයක්ම මාසිකව අවම වශයෙන් කි.මී.3000 ක් ධාවනය කළ යුතු වුවද වාහන 04 ක් කිසිදු මාසයක කි.මී.3000 ක් | ගිවිසුම අනුව ධාවනය කළ යුතු කි.මී.ප්‍රමාණය ධාවනය කරමින් | කුලී පදනම මත ලබා ගත් වාහන 2018 වර්ෂය තුළ ධාවනය කරන ලද දුර පිළිබඳව සමාලෝචනය කර 2019 පෙබරවාරි 01 දින |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ධාවනය කර නොතිබුණි. | දරන ලද පිරිවැයෙහි ආර්ථික භාවයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | සිට අංක WPPH 6552 /WPPH 6558 /WPPH 6568 කුලි පදනම මත ලබා ගත් වාහන තුන වැඩි දුර ප්‍රමාණයන් ධාවනය කරන අංශ තුනක් වෙත අනුයුක්ත කරන ලද අතර, ඉදිරියේදී මාස 06 න් 06 ට ධාවනය කරන ලද දුර සමාලෝචනය කර කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------------------- | | | | |
| i. | මුදල් රෙගුලාසි 138 (8) | 521,800 | වවුචරය නිවැරදිව සහ සෑම විස්තරයක් අතින්ම සම්පූර්ණ බවට ගණන්දීමේ නිලධාරියා සෑහීමට පත් විය යුතු වුවත් අවස්ථා 02 කදී වවුචර් නිර්දේශ කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදනකමිටු තීරණය අනුව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත භාණ්ඩ මිලදී ගෙන නිසි පරිදි වවුචර් පත් පිළියෙල කර ගෙවීම් කටයුතු කර තිබේ. |
| ii. | මුදල් රෙගුලාසි 570 | - | අර්ධ වර්ෂයක් අවසානයේ ඉකුත් වූ සියලු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | ලැයිස්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | තැන්පත් ගිණුමේ ශේෂ සැසදීමෙන් පසු කඩිනමින් සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ<br>----------------------<br>2016 දෙසැම්බර් 01 දිනැති අංක -- 08/2016 දරන චක්‍රලේඛය | අක් මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව සකස් කර නොතිබුණු අතර කාර්තුමය වියදම් සැලැස්මක්ද පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අක් මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව හා කාර්තුමය වියදම් සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. | අක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සෑම වසරකම පිළියෙල කරනු ලබන අතර 2018 වර්ෂයේ සිට කාර්තුමය වියදම් සැලැස්මක් CIGAS වැඩ සටහනෙන් පිළියෙල කර තිබේ. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 අග්‍රිම කළමනාකරණය
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තු වියදම් සඳහා වූ අග්‍රිම ප්‍රතිපාදන සියයට 361 ක් ලෙස තාත්ත්වික නොවන ආකාරයට සංශෝධනය කර තිබුණි. | කාර්තු පදනමින් අග්‍රිම සීමාවන් සංශෝධනය කළද තාත්වික නොවන ආකාරයට සංශෝධන කිරීමට කටයුතු නොකළ යුතුය. | වර්ෂය තුළදී වෙනත් දෙපාර්තමේන්තු මඟින් ඉටුකර ගැනීමට සිදුවන ඉදිකිරීම් කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන නිදහස් කිරීමට සිදු වේ. එබැවින් කාර්තු පදනමින් අග්‍රිම සීමාවන් සංශෝධනය කිරීමට සිදු වේ. |

2.2 වියදම් කළමනාකරණය
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 14 ක් වෙනුවෙන් වෙන්කර තිබුණු එකතුව රු.536,390,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.6.757,050 ක් හෙවත් සියයට 5 සිට සියයට 76 දක්වා පරාසයක ප්‍රතිපාදන | වර්ෂය ආරම්භයේදී ප්‍රසම්පාදන කටයුතු සිදුකර අග්‍රිම ලබාගැනීමට කටයුතු කළ යුතුය. | මහ කන්නයේ වගාවන් සඳහා රෝපණ ද්‍රව්‍ය නිකුත් වනුයේ වර්ෂය අග භාගයේ බැවින් වර්ෂයේ අග භාගයේ දී අග්‍රිම නොලැබීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී |

| | | |
|---|---|---|
| උපයෝජනය නොකර ඉතිරිකර තිබුණි. | | තිබේ. |

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 (2) හි විධිවිධානවලින් බැහැරව දෙපාර්තමේන්තුව විසින් මූලධන වැය විෂයයන් 05 කට අදාළව එකතුව රු.24,216,161 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹී තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළැඹීමට කටයුතු නොකළ යුතු අතර හැකිතාක් වර්ෂයේ වියදම් වර්ෂය තුළ පියවීමට කටයුතු කළ යුතුය. | හදිසි අළුත්වැඩියාවන් පමණක් ඉටුකර ගැනීමට සිදුවීමත් සංවර්ධන වැඩ සටහන යටතේ 2017 වර්ෂයේ අග භාගයේදී අග්‍රිම ලැබීම සීමාවීම මත රු.මිලියන 113 ක ගෙවීම් 3/2-17 දරන අයවැය චක්‍රලේඛය පරිදි නිරවුල් කිරීමට සිදුවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළැඹීමට සිදුවිය. |

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ ව්‍යාපෘති වෙනුවෙන් රු.15,670,339 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද නියමිත පරිදි කාර්යයන් ඉටු නොකර රු.2,479,498 ක් ආපසු යවා තිබුණි. | ලබාදුන් ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට සැලැසුම් සකස් කළ යුතුය. | අදාළ කාර්යයන් ඉටු නොකිරීම මත ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලබා දුන් මෙම ප්‍රතිපාදන ඉතිරි විය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද එකතුව රු.3,724,059 ක් වූ අත්තිකාරම් ශේෂ 121 ක් දින 02 සිට 313 දක්වා කාලයක් මුදල් අත රඳවා ගනිමින් ප්‍රමාදවී පියවා තිබුණි. | ලබාගත් අතුරු අග්‍රිමයන් නොපමාව පියවීමට කටයුතු කළ යුතුය. | මෙම වැඩසටහන් ක්ෂේත්‍ර වැඩසටහන් වේ. එම වැඩසටහන් ඉටු කරනු ලබන බොහෝ කාර්යාලවල ගෙවීම් මුදල් පොත් නොමැති වීම මත අදාළ වැඩසටහන් සඳහා අත්තිකාරම් ලබාදී ඇති අතර එම වැඩ සටහන් විශාල කාල පරාසයක් තුල ක්‍රියාත්මක වීම. උදා. ගොවි පුහුණු වැඩසටහන් ආදිය මෙම වසර පුරාම ක්‍රියාත්මක කාර්යකි. යම් කාර්යක් සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම වැනි කාර්යයන් සඳහා විශාල කාලයක් ගත වේ. |
| (ආ) | අවස්ථා 15 කදී ලබාදුන් එකතුව රු.381,695 ක අත්තිකාරම් මුදල් කිසිදු කාර්යයකට යොදා නොගෙන දින 16 සිට දින 133 දක්වා කාලයක් අත රඳවා ගෙන සම්පූර්ණ මුදලම ආපසු පියවා තිබුණි. | අදාළ මිලදී ගැනීම සඳහා පෙර ඇගැයීම් කටයුතු සිදුකිරීමෙන් පසු අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතුය. | බීජ මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් ලබා දුන්නද සිටු වීමට සුදුසු නිරෝගී බිජ තෝරා ලබා ගැනීමට කාලයක් ගත වීම, වැඩසටහන් නොවැළැක්විය හැකි හේතූන් මත අවලංගු වීම හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වීම මත මෙම අතපසු වීම සිදු වී ඇත. මෙවැනි සිදුවීම් නොවීමට සහ ඇස්තමේන්තු සකස් කිරීමේදී සැලකිලිමත් වීම සඳහා උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) නිලධාරීන්ට අවස්ථා 35 කදී ලබාදුන් එකතුව රු.1,163,430 ක අත්තිකාරම් මුදලින් රු.671,747 ක් හෙවත් සියයට 40 සිට සියයට 95 දක්වා පරාසයකට ඇතුළත් මුදල් ප්‍රමාණයක් නැවත පියවා තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කිරිමට කටයුතු කළ යුතුය. | හදිසි අවශ්‍යතාවයන් බැවින් ඇස්තමේන්තු සකස් කිරිමේදි නිවැරදිව සකස් කිරීමට නොහැකි වි ඇත. |

2.6 තැන්පතු ශේෂයන්

-----------------------

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කොන්ත්‍රාත් සේවකයින් ස්ථිර කිරීම හේතුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලින් දෙපාර්තමේන්තුවට එවා තිබුණු රු.389,480 කින් අනත්දරු විශ්‍රාම වැටුප සඳහා අවශ්‍ය ගැලපීම් නොකර තැන්පතු ලේඛනයේ රඳවා ගෙන තිබුණි. | කොන්ත්‍රාත් සේවකයින් ස්ථිර කිරීමේ හේතුවෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. | සේවකයන් කොන්ත්‍රාත් පදනමින් සේවයට බැඳුන දින සිට වැ.අ.වි.වැ. කප්පාදු කළ යුතු අතර ඒ සඳහා කාලයක් ගතවන බැවින් එතෙක් තැන්පත් නිරවුල් කිරීමට හැකියාව නොමැති වී තිබේ. |

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 සැලැසුම් කිරීම

------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ සැලැසුම් කිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම කාලීනව සංශෝධනය කළ යුතු වුවත් | ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ ක්‍රියාකාරකම් අනුව කාලීනව | 2018 දෙසැම්බර් 21 වන දින දක්වා වූ ප්‍රගතියද සැලකිල්ලට ගෙන ඉලක්ක සංශෝධනය |

| | | | |
|---|---|---|---|
| | 2018 දෙසැම්බර් 26 දිනට ප්‍රගතිය පදනම් කරගෙන සංශෝධනය කර තිබුණි. | සංශෝධනය කළ යුතුය. | කරගෙන ඇත. |
| (ආ) | මූලධන වියදම් වශයෙන් වෙන් කළ රු.500,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.18,080,000 ක් ප්‍රතිපාදන පරිපාලන වියදම් සඳහා වෙන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ එම ප්‍රතිපාදනයෙන් රු.19,680,000 ක මුදලක් මූලධන නොවන මෙහෙයුම් වියදම් සඳහා වැය කර තිබුණි. | මෙහෙයුම් වියදම් මූලධන වැය විෂයයන් යටතේ දැරීමට කටයුතු නොකළ යුතුය. | 289-2-1-1-2202 සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා සෘජුවම දරන ලද ඉන්ධන හා ව්‍යාප්ති නිලධාරි ගමන් වියදම් වැනි මෙහෙයුම් වියදම් මෙම වැඩසටහන යටතේ දැරීමට සිදුවේ. ප්‍රාග්ධන වැය විෂයන් යටතේ වුවත් එය ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ නොවන සෘජු වියදම් ද ඒ යටතේ දැරීමට සිදු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් රු.79,643,440 ක ආදායමක් රැස්කර තිබුණද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2018 සැප්තැම්බර් 14 දිනැති අංක 5/2018 දරන චක්‍රලේඛයේ 1 ප්‍රකාරව ආදායම් එකතු කිරීමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2015 (v) අනුව දක්වා ඇති පරිදි ආදායමේ ඇස්තමේන්තු කිරීම, රැස් කිරීම,අධීක්ෂණය සහ වාර්තා තබා ගැනීම දෙපාර්තමේන්තුව විසින් ඉටුකර තිබේ. |

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------ | ----------------------------- |
| (අ) | සන්නිවේදන මාධ්‍ය ව්‍යාපෘතිය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් රු.19,000,000 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද ක්‍රියාකාරකම් දෙකක භෞතික ප්‍රගතිය සියයට 33ත් සියයට 58 ත් අතර පරාසයක පැවති අතර රු.1,850,000 ක් වූ ක්‍රියාකාරකම් දෙකක භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දිනට ශුන්‍ය මට්ටමක පැවතුණි. | අයවැය මගින් ලබාදෙන ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට සැලැසුම් කළ යුතුය. | ඉදිරියේදී සැලැසුම් කරන ලද අයුරින් රූපවාහිනී වැඩසටහන් ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍ය පූර්ව ප්‍රසම්පාදන කටයුතු කල්වේලා ඇතිව ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ) දෙපාර්තමේන්තුව සතුව මධ්‍යම පැළ තවාන් 10 ක් පැවතියද පැළ නිකුත් කිරීම මුළු පැළ අවශ්‍යතාවයන් සියයට 8.41 ක් වැනි අඩු ප්‍රමාණයක් විය. | දෙපාර්තමේන්තුව සතුව ඇති මධ්‍යම පැළ තවාන් උපරිම හා කාර්යක්ෂම ලෙස යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

3.3 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘතිය
---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කර්මාන්ත 09 ක් සම්බන්ධයෙන් සැලැසුම් කළ දිනයත් සත්‍ය වශයෙන්ම ආරම්භ කළ දිනයත් අතර මාස 04 සිට මාස 10 දක්වා පරාසයක ප්‍රමාදයන් පැවතුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති කාල පරාසයට අනුරූපීව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය. | කර්මාන්ත 01 සිට 05 දක්වා ප්‍රමාදයන් සිදුවී ඇති බව පිළිගන්නා අතර 06 සිට 09 දක්වා නියමිත කාලසටහනක් පිළියෙල කර නොමැති අඩුපාඩුව මඟහරවා ගනිමින් 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර ඇත. |

3.4 ප්‍රසම්පාදනයන්
----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| (අ) මාර්ගෝපදේශ 2.5.1(ආ) ප්‍රකාරව සැලැසුම් කර ඇති පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කාල සටහන් සමාලෝචනය කිරීම කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන කාල සටහන සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන කාල සටහන් සමාලෝචනය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) මාර්ගෝපදේශ 4.2 ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව ඇතුළත් කරමින් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැති අතර ඉදිරියේදී සැලසුමක් සකස් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | | කටයුතු කර ඇත. |
| (ඈ) | මාර්ගෝපදේශ 4.2.2(අ) ප්‍රකාරව එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් කාලක්‍රමානුගතව විස්තර කරන පරිදි අදියර 1 සහ 2 වශයෙන් ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කළ යුතු වුවද සියලුම කාර්යයන් 2018 පෙබරවාරි 01 දින සිට දෙසැම්බර් 12 දින දක්වා යනුවෙන් සඳහන් කර තිබුණි. | අදියර 1 සහ 2 වශයෙන් ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂය වර්ෂයේදී මෙම අඩුපාඩු මගහරවා ගනිමින් විස්තාරාත්මක ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර ඇත. |
| (ඈ) | ප්‍රදානය කරන ලද රු.70,000,000 ක කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විස්තර වෙබ් අඩවියේ පළකර නොතිබුණි. | දෙපාර්තමේන්තුව ප්‍රදානය කරන ලැබූ කොන්ත්‍රාත්කරු සම්බන්ධ විස්තර දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කොන්ත්‍රාත් සම්බන්ධ තොරතුරු වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------ | ------------------------ |
| (අ) | මිද්දෙණිය මධ්‍යම පැළ තවානට ඉල්ලීමකින් තොරව සපයා දී තිබුණු රු.528,589 ක් වටිනා පොලිතීන් බෑග් වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් දක්වා කාලයක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි. | අවශ්‍යතාවය හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී පොලිතීන් මිලදී ගැනීමේදී පවත්නා ශේෂයන් සැලකිල්ලට ගෙන මිලදී ගැනීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 07 ක් මාස 07 සිට වර්ෂ 04 ක් දක්වා කාලයක් වසා දමා තිබුණි. | රජයේ වත්කම් පූර්ණ උපයෝජිතව භාවිතා කළ යුතුය. | ඉදිරියේදී ඌන උපයෝජිතව නොතැබීමට කටයුතු කරන ලෙස සියලුම දෙනා වෙත උපදෙස් දෙන ලදී. |

| | | |
|---|---|---|
| (ඇ) පෞද්ගලික පාර්ශවයන්ට, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හා රජයට අයත් හෙක්ටයාර් 203.29 ක් වූ ඉඩම් කට්ටි 37 ක් පවරා ගැනීමට ක්‍රියා නොකර පරිහරණය කරනු ලබන බව නිරීක්ෂණය විය | පවරා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කළ යුතුය. | දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරන ඉඩම් කැබලි 37 ක් විධිමත්ව පවරා ගැනීම සඳහා ඒ ඒ ආයතන හා සම්බන්ධ වී අදාළ කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) වාහන 34 ක අයිතිය දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය, කෘෂිකර්ම ඉඩම් හා වන විද්‍යා අමාත්‍යාංශය, කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය, කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය, සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය හා ජනවාර්ගික කටයුතු සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

3.6 රජයේ නිළධාරින් ඇප තැබිම

---------------------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්විම |
|---|---|---|
| (අ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක සේවයේ නිලධාරීන් වන අධ්‍යක්ෂක ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් 02, අධ්‍යක්ෂකවරුන් 08, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 05 අතිරේක අධ්‍යක්ෂකවරුන් 45 දෙනෙකු ඇතුලුව නිලධාරීන් 61 දෙනෙකුගෙන් අයවිය යුතු රු.610,000 ක ඇප මුදල අයකර ගැනීමට | ඇප ආඥා පනත හා මුදල් රෙගුලාසි අනුව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙතෙක් ඇප තබා නොමැති නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගේ ඇප තැන්පත් කිරීමට අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා පොදු 235 ආකෘති පත්‍ර අමාත්‍යාංශය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |

කටයුතු කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ ලැයිස්තුව ප්‍රතිශෝධනය කර අදාළ අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඇප ලැයිස්තු ප්‍රතිශෝධනය කර අදාළ අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | ඇප තැබීමට අවශ්‍ය නිලධාරි ලැයිස්තුව සකස් කරමින් පවතී. |

4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංදිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධනය හා ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහනට තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ ඉලක්ක අනුව සකසා අමාත්‍යාංශයට ඉදිරිපත් කර මෙ වන විට අනුමත වී ඇත. |

5. යහපාලනය

--------------

5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 133(2) අනුව වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘති යන මේවායේ ප්‍රගතිය සොයා බැලීම සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාට හා ප්‍රගති/අන්වේෂන කමිටුවට සහායවීමෙහිලා අභ්‍යන්තර විගණන ඒකකයට අයත් කාර්යයන් ඉටුකර | අභ්‍යන්තර විගණන විසින් වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි අභ්‍යන්තර විගණකවරියට අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුමක් හෝ අවබොධයක් |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | | නොතිබුණි. එම කාර්යය මණ්ඩලයද නවක නිලධාරීන්ගෙන් සමන්විත විය. එබැවින් යම් අඩුපාඩු සිදුවී තිබුණද හැකි උපරිම අයුරින් එම කාර්ය මණ්ඩලය, මුදල් රෙගුලාසි 133(2) අනුව මා වෙත සහය ලබා දී ඇත. |
| (ආ) | සෑම වර්ෂයකම ජනවාරි මස 31 දිනට පෙර විගණන වැඩසටහන් හා එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු මූලික වාර්තාව සහ සාරාංශ වාර්තාව ද සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කරගෙන විගණන වැඩසටහන සකස් කර 2018 පෙබරවාරි 26 දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සහ ඔබ වෙත ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී සෑම වර්ෂයකම ජනවාරි 31 දිනට පෙර අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කර ඉදිරිපත් කිරීමට හැකි උපරිම අයුරින් කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සෑම වර්ෂයක් සඳහාම ජනවාරි 31 දිනට පෙර විගණන වැඩසටහනේ පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 අගෝස්තු 31 දින ඉදිරිපත් කර තිබුණි. විගණන සැලැස්ම | නිවැරදිව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේ මැද භාගය වන විට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමියගෙන් ලද උපදෙස් පරිදි 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන සංශෝධනය කිරීමේදී එක් එක් කාර්යය සඳහා අවදානම ගණනය කර ඊට ඇතුළත් කරන ලදි. අදාළ විගණන පරීක්ෂණ ඉටු කිරීමට බලාපොරොත්තු වන කාලය සහ මිනිස් දින ගණන ද නිශ්චිතවම සංශෝධිත අභ්‍යන්තර විගණන වැඩසටහනට ඇතුළත් කරන ලද අතර 2019 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කිරීමේදී අවදානම , කාලය හා මිනිස් දින ගණන නිශ්චිතවම දක්වා ඇති බවද කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ සඳහන් විගණන කාර්යයන්ට අදාළ නොවූ කාර්යාලය තුළ සාමාන්‍යයෙන් සිදුවන පරිපාලන කටයුතු, විගණන විමසුම් වලට පිළිතුරු සකස් කිරීම, විගණන ඡේදවලට සහභාගිවීම, දෛනික ධාවන සටහන් භාරගැනීම, බැංකු සැසඳුම් වාර්තා හා වෙනත් ලිපිලේඛන භාර ගැනීම, එච් අක්ෂර වාර්තා භාරගැනීම වැනි දෛනික කටයුතු වෙනුවෙන් මිනිස් දින 440 ක් හෙවත් සමස්ථ සැලැසුම්ගත කාලයෙන් සියයට 44 ක් වෙන්කර තිබුණි. | 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන චක්‍රලේඛයෙහි සඳහන් විගණන කාර්යයන් සිදු කිරීමට කටයුතු කළ යුතුය. | විගණන කමිටුවලට සහභාගී වීම හා විගණනයට සම්බන්ධ ලිපි ලේඛන භාර ගැනීම විගණන කටයුතුවලට අදාළ වන බව හා අභ්‍යන්තර විගණන අංශය විසින් දෛනික කටයුතු ලෙස දිස්ත්‍රික් කාර්යාල 17 ක, පර්යේෂණ මධ්‍යස්ථාන 03 ක, හා ප්‍රධාන කාර්යාලයේ ගෙවා අවසන් වැයපත්‍ද, වාහන 111 ක දෛනික ධාවන සටහන් හා පිරිවැය වාර්තා, බැංකු සැසැදුම් වාර්තා ඇතුළු වෙනත් ලිපිලේඛනද උප පර්යේෂණ මධ්‍යස්ථාන 03 ක් හා දෙපාර්තමේන්තු පැළ තවාන් 07 කින් ලැබෙන එච් අක්ෂර වාර්තා හා වෙනත් ලිපි ලේඛනද අනිවාර්යෙන්ම පරීක්ෂා කර භාරගෙන අඩුපාඩු හෝ ප්‍රමාද වීම් ඇත්නම් ඒ පිළිබඳව අදාළ නිලධාරීන් වෙත ලිඛිතව දැනුම්දෙනු ලැබේ. |
| (ඉ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව මූලධන ව්‍යාපෘති වෙනුවෙන් රු.500,000,000 ක් වෙන් කර තිබුණද රුපියල් මිලියන 133 ක් වටිනා ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් මිනිස් දින 108 ක් හෙවත් සියයට 11 ක් වැනි ඉතා අඩු අවධානයක් යොමුකර තිබුණි. | සියලු මූලධන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් කාර්යයන් වෙන් වෙන්ව විගණනය කර ඇති අතර බොහෝ මූල්‍ය හා පරිපාලන විගණන කටයුතුවලදී සංවර්ධන වැඩසටහන් පිලිබඳවද පරීක්ෂා කර ඇත. ඒ අනුව කාර්යය සාධන විගණනය කෙරෙහි සැළකිය යුතු අවධානයක් යොමු කර ඇති බව කාරුණිකව දන්වමි. 2019 වර්ෂයේදි 2018 වර්ෂයේ කාර්යය සාධනය කෙරෙහිද අවධානය යොමු කරමින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට සැලැසුම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී අපනයන භෝග පර්යේෂණ කටයුතු වෙනුවෙන් රු.28,500,000 ක් වෙන් කර තිබුණද පර්යේෂණ ක්‍රියාවලියේ ඵලදායිතාවය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයේ අවධානය යොමුකර නොතිබුණි. | පර්යේෂණ කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කළයුතුය. | නාරම්මල අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණයේදී පර්යේෂණ කිහිපයක් පිළිබඳව පරීක්ෂා කර ඇති අතර එහිදී එම පර්යේෂණවල අඩුපාඩු කිසිවක් නිරීක්ෂණය නොවූ බවත් , දැල්පිටිය උප පර්යේෂණ මධ්‍යස්ථානයේ විගණනයේදී එහි ප්‍රමාණවත් පරිදි පර්යේෂණ සිදු නොකරන බවත් අභ්‍යන්තර විගණක විසින් වාර්තා කර ඇත. 2019 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙළ කිරීමේදි පර්යේෂණ විගණනය සඳහා 2018 වර්ෂයට වඩා වැඩි අවධානයක් යොමු කර ඇත. |
| (උ) | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් ප්‍රසම්පාදන විගණනය සඳහා ප්‍රමාණවත් අවධානයක් අභන්තර විගණනය විසින් යොමුකර නොතිබුණි. | ප්‍රසම්පාදන විගණනය සඳහා අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් ප්‍රසම්පාදන කටයුතු විගණනය ඔබ විසින් සිදු කරන බවට අප දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක සමඟ එකඟ වී ඇති බැවින්, එක් කරුණක් පිළිබඳ ද්විත්ව විගණනයක් අනවශ්‍ය බැවින් අභ්‍යන්තර විගණක විසින් එම ප්‍රසම්පාදන කටයුතු විගණනය නොකර ඔබ විසින් විගණනය නොකරනු ලබන නාරම්මල අතුරු භෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන කටයුතු විගණනය කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඌ) | වර්ෂය තුළ සිදු කරනු ලැබූ විගණන කාර්යයන් පදනම් කරගෙන වර්ෂය අවසානයේදී විගණන සැලැස්ම සංශෝධනය කර තිබුණි. | අයවැය ගත ප්‍රතිපාදන අනුව විගණන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, සංශෝධනය කළ | දිස්ත්‍රික්ක 17 ක සියළුම සංවර්ධන වැඩසටහන් විගණනය කිරීම සහ කාලය ප්‍රමාණවත් නොවීම සහ කාර්යය මණ්ඩලය |

| | | |
|---|---|---|
| | යුතුවේනම් සිදු කිරීමට යෝජිත කාර්යයන් අනුව සංශෝධනය කළ යුතුය. | ප්‍රමාණවත් නොවීම යන හේතු නිසා විගණන සැලැස්ම සංශෝධනය කිරීමට සිදු වූ බව කාරුණිකව දන්වමි |

6. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සැලැසුම්ගත ඉලක්ක, අරමුණු, මෙහෙවර හා දැක්ම ඉටුකර ගැනීම සහා අවශ්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් විධිමත් ඇගැයීමක් සිදුකර එය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගත යුතු වුවද එවැනි හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි. | 2017 ජනවාරි 11 දිනැති අංක 01/2017 දරන භාණ්ඩාගාර ලේකම්ගේ කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 05 ඡේදය අනුව කටයුතු කර නොමැත. | අදහස් දක්වා නැත |
| (ආ) අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකර වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන සේවය හැරගිය පර්යේෂණ හා සංවර්ධන සහකාර නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.2,651,500 ක දණ්ඩන මුදල 2019 මැයි මස වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රාජකාරි වෙන් වෙන්ව වැඩ තක්සේරු කිරීමක් සිදුකර එය පදනම් කර අදාළ ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීමට කටයුතු කළ යුතුය. | නීතිපතිගේ අංක C/204/2013/CS හා 2019 අප්‍රේල් 26 දිනැති ලිපියෙන් එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.2,651,500 ක දණ්ඩන මුදල මාසිකව රු.10,000 ක වාරික මඟින් ගෙවීමට අවස්ථාව ලබා දීමට අවධානය යොමු කරන මෙන් දන්වා ඇත.<br><br>ඒ අනුව වාරික මුදල වැඩි කර හෝ දණ්ඩන මුදල වාරික වශයෙන් අයකර ගැනීමට අවස්ථාව ලබාදෙන මෙන් නැවත ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසීමක් කර ඇත. |
| (ඇ) තනතුරු 13 කට අදාළ නිලධාරීන් | ධාරිතා වර්ධනය | 2018 වර්ෂයේ සිදුවූ |

| | | | |
|---|---|---|---|
| | 480 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පුහුණුවීමක් ලබාදී නොතිබුණි. | කෙරෙහි අවදානය යොමු කළ යුතුය. | අඩුපාඩු සැලකිල්ලට ගෙන 2019 වර්ෂයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා පුහුණු අවශ්‍යතා ලබාදෙන ලෙස දක්වා ඇත. |
| (ඉ) | පැළ තවාන් 11 ක තනතුරු 06 ක් සඳහා පුරප්පාඩු 50 ක් 2018 දෙසැම්බර් 31 දිනට පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | දැනට තනතුරු 19 කට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. අනෙකුත් පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |